# සිංහලයන්ගේ දෙවන නිදහස් සටන - හෙවත් 1848 කැරැල්ල.

ආචාර්ය පූජ්‍ය ඔලගන්වත්තේ චන්දසිරි හිමි
කථිකාචාර්ය ප්‍රසාද් කුමාර
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

1833 සිට ක්‍රියාත්මක වූ කොල්බෲක් ප්‍රතිසංස්කරණ හේතු කොට ගෙන ලංකාවේ සමාජ, ආර්ථික, හා දේශපාලනික ක්ෂේත්‍රයෙන් වෙනස්කම් රාශියක් ඇති වී තිබේ. මෙයින් යම් යම් අයහපත් මෙන්ම යහපත් ප්‍රතිඵල ද ඇති වී තිබේ. මේ නිසා කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ හේතු කොට ගෙන ඇති වූ යම් යම් දුර්වලතාවන් 1848 කැරැල්ලට බලපා තිබේ. 1818 දී ද ඉංග්‍රීසීන්ට විරුද්ධව කැරැල්ලක් ඇති වූ අතර එහි නායකත්වය උසුලනු ලැබුයේ උඩරට නිළමේ වරුන් විසිනි. ඔවුන් එම කැරැල්ලට නායකත්වය සැපයීමට එක් හේතුවක් වූයේ ඉංග්‍රීසි පාලනය යටතේ තම වරප්‍රසාදයන්ට පහර වැදීමයි. කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ හේතු කොට ගෙන මෙරට සාමාන්‍ය ජනතාවට ද පහර වැදිණි. එමගින් බිහි වූ ආර්ථිකය සාමාන්‍ය ජනතාවගේ ඕනෑ එපාකම් නැතහොත් අපේක්ෂාවන් සැලකිල්ලට ගෙන සකස්වීමක් නොවිය. මේ හේතුවෙන් 1833 ත් 1845 ත් අතර කාලයේදී සාමාන්‍ය ජනතාවට විවිධ දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදුවණු බව පැහැදිලිය. ඉංග්‍රීසීන්ගේ වතු වගා කටයුතු වලට සාමාන්‍ය ජනතාවගේ ඉඩම් අත්පත් කර ගැනීම නිසා තම ගම් බිම් අහිමි වනු දැකීමට ඔවුන්ට සිදුවිය. මේ නිසා දීර්ඝ කාලපරිච්ඡේදයක් තිස්සේ තමන් භුක්ති විඳි තෘප්තිමත් සමාජ මට්ටම අහිමි වෙමින් පැවතිණි. ඊට අමතරව ඉංග්‍රීසීන් අනුගමනය කළ යම් යම් ප්‍රතිපත්තින්ද මෙරට ජනතාවගේ අපේක්ෂාවන්ට පටහැනි විය. විශේෂයෙන් බුද්ධාගම සම්බන්ධයෙන් ආණ්ඩුව අනුගමනය කළ ප්‍රතිපත්තිය මහජනතාව අතර කනස්සල්ලක් ඇතිවීම කෙරෙහි බලපා තිබේ. රජයේ ආදායම වැඩිකර ගැනීම සඳහා වැඩි වැඩියෙන් බදු අයකර ගැනීමට ඉංග්‍රීසින් ක්‍රියා කිරීම සාමාන්‍ය ජනතාවගේ ආර්ථික තත්වයට තදබල ලෙස පහර වැදිණි. මෙවැනි පසුබිමක් යටතේ 1845 දී ඉංග්‍රීසින්ට විරුද්ධව නැවත අරගලයක් ඇති වූ අතර එය සිංහලයන්ගේ දෙවන නිදහස් සටන් ව්‍යාපාරය හෙවත් 1848 කැරැල්ල වශයෙන් හැඳින්වේ.

කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ වලින් පසුව ආණ්ඩුව ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරණු ලැබිය. ඒ අනුව වතු වගා ප්‍රදේශවල ඉඩම් සීඝ්‍රයෙන් විකිණී ගිය බව පෙනේ 1833 ත් 1835 ත් අතර කාලය තුළ ආණ්ඩුව විකුණූ ඉඩම් ප්‍රමාණය දළ වශයෙන් අක්කර 6,500 පමණ විය. 1840 වන විට ආණ්ඩුව විකුණූ ඉඩම් ප්‍රමානය ඉහල යාම කෙරෙහි ඉංග්‍රිසින් විසින් ක්‍රියාත්මක

කළ මඩුබිම් පනත හේතු වී තිබේ. මුඩු බිම් පනතින් සිදුවූයේ වගා කටයුතු සඳහා යොදවා ගතහැකි එහෙත් යොදවා ගෙන නොමැති ඉඩම් රජයට පවරා ගැනීමයි. ඒ තුළින් වතු වගාව ආශ්‍රිත ඉඩම් සීඝ්‍රයෙන් විකිණී ගියේය. 1840 වන විට රජය විකුණූ ඉඩම් ප්‍රමාණය අක්කර 42,500 ක් වන අතර 1841 වන විට එය අක්කර 79,000 දක්වා වර්ධනය විය. එමෙන්ම 1843 වන විට අක්කර 2,60,000 ක් වතු වගාව සඳහා විකිණී ගොස් තිබේ. මෙසේ රජයේ ඉඩම් විකිණී යාම වතු වගාව ආශ්‍රිත ගොවියන්ගේ ගොවිතැන් කටයුතු වලට තදබල ලෙස පහර වැදුණි. ඊට හේතුව සැලැස්මකින් තොරව කඳු ප්‍රදේශ හෙළි පෙහෙළි කිරීම නිසා රොන් මඩ සෝදා ගොස් පහළ ගොවි බිම් ප්‍රදේශවල තැන්පත්වීම නිසා ඒවා වගා කටයුතුවලට යොදා ගැනීම අපහසු වූ හෙයින් පාරම්පරක කෘෂිකර්මාන්තයේ නියැලුණු දේශීය ගොවීන්ට ඒ තුළින් පහර වැදීමයි.

වතු වගාවේ ඇති වූ දියුණුවත් සමග අලුත් රැකියා අවස්ථාවන් බිහි විය. එහෙත් සාමකාමී කෘෂිකාර්මික දිවි පෙවෙතකට හුරුව සිටි මහනුවර වැනි ප්‍රදේශවල වැසියෝ ඒ නව රැකියා අවස්ථාවන්වල යෙදීමට අකමැති වූහ. වතු වගා කටයුතුවලට ඒ ප්‍රදේශවලට ඇතුළු වූ යුරෝපීයන්ව සාමාන්‍ය වැසියන් විසින් දකිනු ලැබුවේ තම තමන්ගේ ඉඩම් කඩම් පැහැර ගැනීමට පැමිණි ආක්‍රමණිකයන් වශයෙනි, මේ නිසා වතු වගා කටයුතුවල යෙදුණු ව්‍යාපාරිකයින් හා සාමාන්‍ය ගොවි ජනතාව අතර යහපත් සම්බන්ධතාවයක් නොමැති වීම ඉංග්‍රීසින්ට විරුද්ධව ජන මතයක් ඇති වීම කෙරෙහි බලපා තිබේ. වතුවගාවේ වර්ධනයත් සමග බිහි වූ රැකියා අවස්ථාවල යෙදීමට සිංහලයන් අකමැතිවීම නිසා ඒ සඳහා ඉන්දීය ද්‍රවිඩ කම්කරුවන් විශාල වශයෙන් ගෙන ඒම නිසා නොයෙකුත් සමාජීය, සංස්කෘතික ගැටලු ඇති විය. එමෙන්ම උඩරට හා පහත පළාත් ඒකාබද්ධ වනසේ ඉංග්‍රීසින් පළාත් බෙදීමත්, පහත රටියන් විශාල පිරිසක් උඩරට ප්‍රදේශ වලට පැමිණීමත් නිසා ඇතිවූ නොයෙක් සමාජීය හා සංස්කෘතික ගැටලූ ඉංග්‍රීසින්ට විරුද්ධව ජනමතයක් ඇතිවීම කෙරෙහි බලපා තිබේ.

එසේම ඉංග්‍රීසි පාලන ක්‍රමය යටතේ උඩරට ප්‍රදේශවල සීඝ්‍රයෙන් තැබෑරුම් වැඩිවීයාමත් සමග රජයේ සුරාබදු ආදායම ඉහළ යන බැවින් ආණ්ඩුව රේන්ද ව්‍යාපාරවලට ධෛර්ය ලබා දෙනු ලැබීය. මත්පැන් පානය පැතිර යාමේ අතුරු ප්‍රතිඵලයක් වශයෙන් නීති විරෝධී කටයුතු හා දාමරික කටයුතු කෙරෙහි ජනතාව පෙළඹිණි. ඒ අනුව සුළු සුළු දේවලට පවා ජනතාව නඩු මගට බැසීම නිසා උසාවිවල නඩු ගොඩ ගැසිණි. පැරණි පාලන ක්‍රමය යටතේ එවැනි සුළු නඩු හබ විසඳීමේ බලය ගම්සභාවලට පැවරී තිබුන ද, කෝල්බෲක් ප්‍රතිසංස්කරණ ගම්සභා ක්‍රමය පරිහානියට පත්ව තිබුණු බැවින් එබඳු ආයතනයකින් හෝ සහනයක් ලබා ගැනීමට ජනතාවට දුෂ්කර විය. ඉංග්‍රීසින්ගේ අධිකරණ ක්‍රමය සැකසී පවතුණේ යුරෝපීය ක්‍රමයට අනුවය. ඒවායේ විනිශ්චය කරුවන් යුරෝපීය වූ අතර නඩු විභාග කරනු ලැබුවේ ඉංග්‍රීසි භාෂාවෙනි. එසේම එම අලුත් අධිකරණ ක්‍රමය

කෙරෙහි සාමාන්‍ය ජනතාවට හොඳ අවබෝධයක් නොතිබිණි. එසේම නියම ලෙස නීතිය ඉටු කර ගැනීමේදී නීතිඥයන් ගෙන් සහය ලබා ගැනීමට සිදු වූ අතර ඒ සඳහා අධික මුදලක් දැරීමට සිදුවිය. මේ නිසා සාමාන්‍ය ජනතාවට නීතිය තුළින් ද පිළිසරණක් නොලැබිණි. එය ද, ඉංග්‍රීසින්ට විරුද්ධව ජනමතයක් ඇතිවීම කෙරෙහි බලපා තිබේ.

කෝල්බෲක් ප්‍රතිසංස්කරණ හේතුකොටගෙන රාජකාරි ක්‍රමය අහෝසි කිරීම නිසාද ගම්බද ආර්ථිකයට තදබල ලෙස පහර වැදුණි. අතීතයේ සිටම ගම්වල වාරි කර්මාන්ත කටයුතු සකස් කිරීම භාරවී පැවතියේ ගම්සභාවටය. එහෙත් කෝල්බෲකි - කැමරන් ප්‍රතිසංස්කරණ යටතේ අනිවාර්ය රාජකාරි සේවා ක්‍රමය අහෝසි කිරීම නිසා ගම් සභාවට අවශ්‍ය ශ්‍රමය සපයා ගැනීම අපහසු විය.ඒ අනුව ග්‍රාමීය ප්‍රදේශවල සංවර්ධන කටයුතු ඇන හිටීම 1848 කැරැල්ල ජනතාව ඒකරාශි වීම කෙරෙහි බලපා තිබේ.

1848 කැරැල්ලට බලපෑ, ආසන්නම හේතු සාධකය වන්නේ ඉංග්‍රීසින්ගේ වන බදු ප්‍රතිපත්තියයි.1846 වන විට කෝපි වගාව පරිහානියට පත්වීම නිසා ආණ්ඩුවට මුදල් දුෂ්කරතාවයන් ඇතිවිය. ආණ්ඩුවේ ආදායම අඩුවීම නිසා ඒ අඩුව පියවා ගැනීම සඳහා අලුත් බදු වර්ග කීපයක් ක්‍රියාත්මක කිරීමට සිදුවිය. මේ යටතේ බෝට්ටු, බරකරත්ත, කඩසාප්පු මාර්ග ආදිය බදු පනවනු ලැබීය. ඒ හැරුණු විට ගෙවල්වල ඇතිකළ සුනඛයන්ට බද්දක්, ගෙවීමට සිදු වූ අතර මෙය දැඩි නින්දා සහගත ලෙස සලකනු ලැබේ. එමෙන්ම ඉස්තෝප්පු බද්ද යනුවෙන් වසර 50 කට වඩා පැරණි නොවූ මාර්ගයේ ආසන්නයේ ඉදි කර තිබූ ඉස්තෝප්පුවලට බද්දක් අය කරන ලදි. නැතහොත් ඒවා විනාශයට පත් කරණ ලදි. එමෙන්ම තම ගොවි බිම් වන සතුන්ගෙන් ආරක්‍ෂා කර ගැනීම සඳහා භාවිතා කළ තුවක්කුවලටද බද්දක් ගෙවීමට සිදු වූ අතර එය වසරක් පාසා අලුත් කර ගැනීමට සිදු විය. ඒ තුළින් ඉංග්‍රීසින්ට විශාල ආදායමක් හිමි විය. එම තුවක්කුවලට බදු ගෙවීම සඳහා ඉල්ලුම් පත්‍ර පිරවීමට පැවතියේ ඉංග්‍රීසි භාෂාවෙනි. ඒ අනුව සිලිං 10-15 ත් අතර ප්‍රමාණයක් එය පුරවා ගැනීම සඳහා අතර මැදියන්ට ගෙවීමට සිදුවිය. එම නිසා එම අලුත් බදු වර්ග පැනවීම හේතුකොට ගෙන ජනතාව තුළ ආණ්ඩු විරෝධී බලවත් පිරිසක් ඉස්මතු වූ බව පෙනේ.

1848 කැරැල්ලට පසුබිම නිර්මාණය වීමේදී බුදු දහම සම්බන්ධයෙන් ඉංග්‍රීසින් අනුගමනය කළ ප්‍රතිපත්තිය ද බෙහෙවින් වැදගත් වේ. මේ වන විට ලක්දිවට පැමිණ සිටි විදේශීය පූජකවරු 1815 ගිවිසුම මගින් බුදු දහම හා රජය අතර පැවති සම්බන්ධය නොරිස්සූහ. දැඩි ක්‍රිස්තියානි බැතිමතෙකු වූ මැකෙන්සි ආණ්ඩුකාරවරයා 1840 දී ප්‍රධාන විහාරස්ථානවල භික්ෂූන් වහන්සේලා පත් කිරීමේ අක්තපත්‍ර අත්සන් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබීය. එසේම 1844 දී යටත් විජිත භාර ලේකම්වරයා වූ ස්ටැන්ලි බුදුදහම හා රජය අතර පැවති සම්බන්ධය අවසාන කරන

ලෙසට ආණ්ඩුකාරවරයාට කියා සිටියේ ය. 1848 දී යටත් විජිත භාර ලේකම්වරයා දළඳාව මහතෙරුන් වහන්සේලාට හා නිළමේ වරුන්ට භාර දෙන ලෙස ප්‍රකාශ කරනු ලැබීය. දළඳා මාලිගාවේ නඩත්තු කටයුතු සඳහා රජය වාර්ෂිකව ගෙවූ රන් පවුම් 350 වෙනුවට එපමණ වූ මුදලක් උපයා ගත හැකි ඉඩමක් ලබා දෙන ලෙස යටත් විජිත භාර ලේකම්වරයා දන්වා තිබේ. ඉංග්‍රීසින්ගේ ප්‍රතිපත්තිය නිසා රජය හා බුදු දහම අතර සම්බන්ධය දුරස්ථ විය. එහි ප්‍රතිඵලය වූයේ භික්ෂූන් කලකිරීමට පත්වීමයි. රාජකාරි ක්‍රමය අවලංගු කිරීම නිසා ද එම සේවාවන් ලබා ගැනීමට ද දුෂ්කර වූයෙන් ඇතැම් විහාර වළ යම් යම් ප්‍රතිසංස්කරණ පවා අඩාල විය. මේ නිසා භික්ෂූන් හා පොදු ජනතාව අතර ඇති වුණු කලකිරීම 1845 කැරැල්ලට බලපා තිබේ.

1818 කැරැල්ලෙන් පසු උඩරට නිළමේවරුන්ගේ බලතල හා වරප්‍රසාද අහෝසි කරන්නට ඉංග්‍රීසින් පියවර ගනු ලැබීය. සාම්ප්‍රදායික පාලන ක්‍රමය යටතේ ජනතාවට නායකත්වය සපයනු ලැබුවේ උඩරට නිළමේවරුන්ය. උඩරට නිළමේවරුන්ට ලැබී තිබුණු තත්වයට වඩා වැදගත් වන්නේ ඔවුන්ගේ කීර්තිය හා වරප්‍රසාද වතුවගා ව්‍යාපාර පැවතීමත් සමග අහිමි වී යාමයි. යුරෝපීයන් ව්‍යාපාරික කටයුතු කෙරෙහි වැඩි වැඩියෙන් නිරත වීම නිසා සාම්ප්‍රදායික රදළයින්ගේ සමාජ තත්වය බිඳ වැටීමක් ඇති විය. පැරණි පාලන ක්‍රමය යටතේ රජු හා මහජනතාව සම්බන්ධ කළ පුරුක වශයෙන් ක්‍රියා කළේ උඩරට නායකයින්ය. සිවිල් සේවක කටයුතු පරිහානියට පත්වීමත් සමග ග්‍රාමීය ජනතාව හා රජය සම්බන්ධතාවය තව දුරටත් දුරස්ථ විය. කෝල්බෲක්ගේ සිවිල් සේවා ප්‍රතිසංස්කරණ නිසා 1833 ට පසු සිවිල් සේවය අකාර්යක්ෂම එකක් බවට පත් විය. සිවිල් සේවකයින් වැඩි වැඩියෙන් පුද්ගලික ව්‍යවසාය කටයුතු වලට නියැලීම නිසා මොවුන් සිය රාජකාරි කටයුතුවල නියැලිණි. මේ අනුව ඈත ගම් දනවු ප්‍රදේශවලට ගමන් කොට ඒවායේ අඩුපාඩු කම් සොයා බලා පිළියම් යෙදීමෙන් ඈත් වීම නිසා සිවිල් සේවක කටයුතු අඩපන වීම ඉංග්‍රීසින්ට විරුද්ධ වන මතයක් ඇති වීම කෙරෙහි බලපා තිබේ.

1848 කැරැල්ලට බලපෑ ආසන්නම හේතු සාදක වන්නේ ජනතාවට වඩාත් හිංසාකාරී ලෙස පනවනු ලැබූ සුනඛ බද්ද, ඉස්තොප්පු බද්ද, තුවක්කු බද්ද යන නව බදු ප්‍රතිපත්තීන්ය. මෙවැනි බදු ප්‍රතිපත්තීන් තුළින් ජනතාව පීඩනයට පත්ව සිටින අතර රජය වාර්ෂිකව පිළියෙල කරන රජයේ වාර්තා පොතට තොරතුරු ලබා ගැනීම සඳහා ජනතාවගෙන් ප්‍රශ්න මාලාවක් විමසන ලදි. එය බදු වර්ග පනවන්නට යොදන උපක්‍රමයක් ලෙස ජනතාව කල්පනා කළ බව පෙනේ. 1848 ජූලි මස අලුත් බදු වර්ගවලට විරුද්ධත්වය ප්‍රකාශ කිරීමට බොරැල්ලේදී රැස්වීමක් පවත්වනු ලැබීම, එසේම ගාල්ල, නුවර වැනි ප්‍රධාන නගර කිහිපයක් එවැනි රැස්වීම් පැවැත්විණි. එම රැස්වීම් වලදී රජයේ නිලධාරීන් හා ජනතාව අතර සුළු අසහනයක් ඇති වී තිබුණි. කාලපරිච්ඡේද සාමාන්‍ය ජනතාව තුළින් ඉස්මතු වූ නායකයන් වූ පුරන්අප්පු, ඩිංගිරාළ, ගොංගාලේ ගොඩ බණ්ඩා වැන්නන් ජනතාවට

නායකත්වය දෙමින් ඉංග්‍රීසින්ට විරුද්ධ ආයුධ සන්නද්ධ අරගලයක් දක්වා විකාශනය කරනු ලැබීම සමග එය කැරැල්ලක් බවට පරිවර්ථනය විය. 1818 කැරැල්ල ප්‍රධාන වශයෙන් ඌව වෙල්ලස්ස ප්‍රදේශයට සීමා වුවද 1848 කැරැල්ල ලක්දිව මුළුල්ලේම ව්‍යාප්ත විය. මහනුවර, මාතලේ, දඹුල්ල, වාරියපොළ, කුරුණෑගල වැනි ප්‍රදේශවල සීඝ්‍රයෙන් මෙම කැරැල්ල කෙටිකාලීනව මර්දනය කරනු ලැබීය.

1818 කැරැල්ල හා සසඳන විට මෙහිදී ඉංග්‍රීසින්ට විඳින්නට සිදු වූ අලාභය ඉතා අඩු බව පෙනේ එහෙත් ආණ්ඩුව අනුගමනය කළ දැඩි මර්දනකාරී ක්‍රියා පිළිවෙත නිසා සිංහලයන්ට විඳින්නට සිදු වූ අලාභය වැඩි බව පැහැදිලිය. නමුත් එම කැරැල්ලේහි වැදගත් ප්‍රතිඵල රාශියක් ඇති වී ඇත. එම කැරැල්ලෙහි ප්‍රතිඵලයක් වශයෙන් එවකට ලක්දිව සිටි ටොරින්ටන් සාමි ආණ්ඩුකාරවරයාත්, සටන් විජිත ලේකම්වරයා වූ ට්‍රෙන්ත් එම තනතුරුවලින් ඉවත් කොට නැවත බ්‍රිතාන්‍යට කැඳවන ලදි. එම ජනතා නැගිටීම පිළිබඳව සොයා බැලීමට බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව මගින් විශේෂ කමිටුවක් පත් කරනු ලැබීය.

එමෙන්ම එම කැරැල්ලේ ප්‍රතිඵලයක් වශයෙන් සුනඛ බද්ද, කඩ සාප්පු බද්ද, මාර්ග හද්ද, ආදී අසහනකාරී බදු ප්‍රතිපත්ති කිහිපයක් ඉවත් කළේය. එමෙන්ම 1848 කැරැල්ලෙහි ප්‍රතිඵලයක් වශයෙන් යළිත් රජය හා බුදු දහම අතර සම්බන්ධය වර්ධනය කිරීමට ඉංග්‍රීසින් පියවර ගෙන තිබේ. එනම් දළඳා මාලිගාවේ ආරක්ෂාව යළිත් ඉංග්‍රීසි ආණ්ඩුව වෙත යොමු කරන ලදි. එමෙන්ම 1848 කැරැල්ලේ ප්‍රතිඵලයක් වශයෙන් ලංකාවේ සුළු නිලධාරින් ගේ සහයෝගයකින් තොරව ලංකාව පාලනය කිරීම දුෂ්කර බව අවබෝධ කර ගැනීම නිසා ඔවුන්ගේ බලතල යළි ලබා දෙන්නට ක්‍රියා කරනු ලැබීය. 1848 කැරැල්ලේ ප්‍රතිඵලයක් වශයෙන් දේශීය ජනතා සුබසාධනය කෙරෙහිද ඉංග්‍රීසින් යොමු වූ අතර පාරම් පරික කෘෂිකර්මාන්තය නගා සිටුවීම සඳහා පැරණි වාරි කර්මාන්ත ප්‍රතිසංස්කරණු ලැබීය. එමෙන්ම දකුණු පළාතේ කිරම හා ඌරු බොක්ක වාරි කර්මාන්ත කටයුතු ප්‍රතිසංස්කරණය කිරීමටත් ක්‍රියා කිරීම ඊට උදාහාරණයක් ලෙස දැක්විය හැකිය. 1818 කැරැල්ල සමග සසඳන විට 1848 කැරැල්ලට දැඩි ලෙස බලපානු ලැබුයේ සාමාන්‍ය ජනතාවට විඳින්නට සිදු වූ දුෂ්කරතාවන්ය. ඒ අනුව 1848 කැරැල්ල මෙරට සාමාන්‍ය ජනතාවගේ නායකත්වය තුළින් ඉස්මතු වූ කැරැල්ලක් වන අතර ඉංග්‍රීසින්ට විරුද්ධව ගෙන ගිය අවසාන ආයුධ සන්නද්ද අරගලය වීමද වැදගත් වේ. 1848 කැරැල්ල හෙවත් සිංහලයන්ගේ දෙවන සටන් ව්‍යාපාරය අසාරථකත්වයට කැරැල්ලේ අසංවිධාත්මක භාවයත්, ඉංග්‍රීසින්ගේ දැඩි මර්ධනකාරී ක්‍රියා පිළිවෙත බලපා තිබේ. සාමාන්‍ය ජනතාව පවා නොබියව ආයුධ රැගෙන ඉංග්‍රීසින්ට විරුද්ධව අරගලයට පැමිණීමෙන් ඒ තුළ කිසියම් ජාතිකානුරාගී ස්වරූපයක් පැවති බව පැහැදිලි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය.


අභයසිංහ, ටිකිරි, පරංගි කෝට්ටේ, පන්නිපිටිය.

කරුනානන්ද උක්කු බණ්ඩා, (1999). ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය, බ්‍රිතාන්‍ය පාලන සමය, කොළඹ.

ඩොනමෝර් වාර්තාව, (ආණ්ඩුක්‍රමය පිළිබඳ සකස් කරන ලද විශේෂ කොමිෂන් සභාවේ වාර්තාව). සිංහල පරඃ රා.හා.දෙ. (1960).

ධර්මදාස කේ.එන්.ඕ (2002) ජාත්‍යානුරාගය, බොරලැස්ගමුව.

බණ්ඩාර ඒ.එම්. නවරත්න. (2007), බ්‍රිතාන්‍ය යටත්විජිත යුගයේ ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරය, කොළඹ.

රොහණධීර, මැන්දිස්, (1969), අස්ගිරි තල්පතින අලුත්වන ලංකාවේ ඉතිහාසාය, විද්‍යෝදය විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය, ගංගොඩවිල.